| | |
|---|---|
| **මහ/මහාමායා බාලිකා විදුහල**<br>**MAHAMAYA GIRLS' COLLEGE** | |
| අවසාන වාර පරීක්ෂණය - 2022 (2021) | **ශ්‍රේණිය - 7** |
| **බුද්ධ ධර්මය** | පැය **2** |

**විභාග අංකය / Index No** ..................................

## 1 කොටස

- ප්‍රශ්න සියල්ලටම පිලිතුරු සපයන්න
- නිවැරදි පිලිතුරට යටින් ඉරක් අඳින්න.

01) සැරියුත් හිමියන්ගේ පැවිදි වීමට පෙර නම වූයේ,

1) කෝලිත
2) ආනන්ද
3) යස
4) උපතිස්ස

02) බුදුන් වහන්සේ විසි දහසක් රහතුන් පිරිවරා කිඹුල්වත් පුරයට ළඟා වූයේ,

1) මැදින් පුර පසළොස්වක
2) වෙසක් පුර පසළොස්වක
3) ඇසළ පුර පසළොස්වක
4) නිකිනි පුර පසළොස්වක පොහෝ දිනය

03) බුදුන් වහන්සේ බුද්ධෝපස්ථානයට සමාන කළේ,

1) ගිලානෝපස්ථානයයි
2) අසරණ සරණයයි
3) සත්ව කරුණාවයි
4) පරිසර සංරක්ෂණයයි

04) නාලාගිරි ඇතු දමනය කිරීම අයත් වන්නේ බුදුන් වහන්සේගේ,

1) ලෝකවිදූ
2) අරහං
3) සුගත
4) පුරිස ධම්ම සාරථී ගුණයටයි.

05) "ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ" යන කවිය අයත් කෘතිය වන්නේ,

1) සිරිත් මල්දම
2) බුදුගුණාලංකාරය
3) පිරුවානා පොත් වහන්සේ
4) ලෝවැඩ සඟරාව

06) පන්සලේදීත් පාසලේදීත් අනුගමනය කළ හැකි පොදු චාරිත්‍රයකි

1) නිල ඇඳුමෙන් සැරසී සිටීම
2) හිස්වැසුම් පාවහන් ගලවා ඇතුල් වීම
3) පොදු දේපල ආරක්ෂා කිරීම
4) විනීතව හැසිරීම

07) කරණීය මෙත්ත සූත්‍රයට අනුව ථූලා යනු,

1) තැති ගන්නා සුළු
2) උපන්
3) නූපන්
4) වටකුරු ශරීර ඇති සත්වයෝය

08) “කෙලෙස් දුරුකළ බැවින් කාමයෙහි නොඇලුණු නිවී සැනසුණ සිත් ඇති තැනැත්තා සියලු කල්හිම සුවසේ සැතපෙනවා” යැයි බුදුන් වහන්සේ දේශනා කළේ,

1) මිගාර
2) පූර්ණවර්ධන
3) සුදත්ත
4) මෙණ්ඩක සිටුවරයාටය

09) “අක්කොච්ඡි මං අවධි මං” යන ධම්ම පද ගාථාව බුදුන් වහන්සේ දේශනා කළේ,

1) ථුල්ල තිස්ස
2) මුගලන්
3) ආනන්ද
4) සැරියුත් හිමියන් මුල්කරගෙනය

10) සීලය යනු,

1) සිත
2) කය
3) සිත - කය
4) කය වචනය සංවර කර ගැනීමය

11) මිච්ඡා ආජීවා වේරමණී යනු,

1) යහපත් ජීවන ක්‍රමයයි
2) වැරදි ජීවන ක්‍රමයෙන් මිදීමයි
3) ගොවිතැනින් ජීවත් වීමයි
4) ඉහත කිසිවක් නොවේ.

12) සිඟාලෝවාද සූත්‍රයට අනුව ගුරු - සිසු සබඳතාවය සමාන කොට ඇත්තේ,

1) නැගෙනහිර
2) බටහිර
3) දකුණු
4) උඩු දිසාවටය

13) පාසලේ ශිෂ්‍ය නායිකාවක තුළ තිබිය යුතු නායකත්ව ගුණාංගයකි,

1) තනි තීරණ ගැනීම
2) හැම විටම තමන් නිවැරදි යයි සිතීම
3) අන් මතවලට ගරු කිරීම
4) වගකීම් අන් අයට පවරා තමන් නිදහසේ සිටීම

14) ආත්මාර්ථය මෙන්ම පරාර්ථයද සලසාලන මෙලොව, පරලොව දියුණුව උදාකරණ උතුම් ගුණාංගය වනුයේ,

1) ඉවසීමයි
2) තෘෂ්ණාවයි
3) ඡන්දයයි
4) මෝහයයි

15) උද්භිද විද්‍යාත්මක හේතු පෙන්වන න්‍යාම ධර්මය වනුයේ,

1) බීජ
2) උතු
3) ධම්ම
4) චිත්ත නයාමයයි

16) බුදුන් වහන්සේ රෝග හට ගන්නා ක්‍රම අටක් පිලිබඳව දේශනා කළ සූත්‍රය වනුයේ,

1) දම්සක් පැවතුම්
2) මහා මංගල
3) ගිරිමානන්ද
4) වේළුද්වර සූත්‍රයයි

17) තමා මුල්කොටගෙන සිත සදාචාරයේ යෙදවීම

1) ලෝකාධිපති
2) අත්තාධිපති
3) ධම්මාධිපති
4) අවිහිංසාවාදී ධර්ම මාර්ග ක්‍රමයයි

18) සංඝමිත්තා තෙරණිය ජයශ්‍රී මහා බෝධි ශාඛාව සමඟ ලංකාවට වැඩම කළේ

1) ඇසළ
2) වෙසක්
3) උඳුවප්
4) නිකිණි පොහෝ දිනය

19) සිඟාලෝවාද සූත්‍රයට අනුව තම ධනයෙන් ආයෝජනය සඳහා,

1) කොටසක්
2) කොටස් තුනක්
3) කොටස් හතරම
4) කොටස් දෙකක් වෙන් කළ යුතුයි

20) දොලොස් පින් කිරියවත් ඇතුළත් කාව්‍ය කෘතිය වනුයේ,

1) කාව්‍යශේඛරයයි
2) බුදුගුණ අලංකාරයයි
3) ලෝවැඩ සඟරාවයි
4) සිරිත් මල්දමයි

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න

01. පහලින් දී ඇති හිස්තැනට සුදුසු පිළිතුර තෝරා ලියන්න

i. නොකා නොබී ධනය උපයා මිය යන්නේ.................................................................... ය.

ii. විශාඛා මහා උපාසිකාගේ මව ........................................................................... ය.

iii. ..................................................... යනු වැරදි පුරුදු නිසා හටගන්නා ආබාධයකි.

iv. වේළුද්වාර ගම් වැසි බ්‍රාහ්මණ ගෘහපතිවරුන්ට බුදුන් වහන්සේ ........................................ ධර්මය ඇතුලත් වේළුද්වාර සූත්‍රය දේශනා කරයි.

v. අඹු - සැමි සදාචාරය ආරක්ෂා වීමට ........................................................... ශික්ෂා පදය ඉවහල් වේ.

vi. තමා තමන්ගේම කයට දුක් දීම ....................................................................... යි.

vii. .................................................. බුදුන් වහන්සේ තම ජීවිත ආදර්ශයෙන් පෙන්වා දුන් අවස්ථාවක් ලෙස අනිමිස ලෝචන පූජාව හඳුන්වා දිය හැක

viii. කිසියම් සමාජයක අන්‍යෝන්‍ය උපකාරය සහයෝගය ඇතිව එක්ව ක්‍රියා කිරීම ..........................................................යි

ix. .........................................................යනු තේ බොනවා යන්නට ශාසනික වචනයයි.

x. ....................................................... අයත් වන්නේ සමාධියටයි.

(අජද්ධුමාරිකයින්/ සම්මා සතිය/ ගිලන්පස වළඳනවා/ අත්තුප්පනායික ධර්මය/ අත්තකිලමථානුයෝගය/ විෂම පරිහාරජ ආබාධ/ සහජීවනය/ කළගුණ සැලකීම/ කාමයෙහි වරදවා හැසිරීමෙන් වැලකීම/ සුමනා දේවිය)

( ල 2× 10 = 20)

02.

i. බුදුන් වහන්සේගේ අසරණ සරණ ගුණය පෙන්නුම් කරන අවස්ථා 2ක් ලියන්න (ල 2)

ii. ඉන් එක් අවස්ථාවක් කෙටියෙන් ලියන්න (ල 3)

iii. ගිලානෝපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග 5ක් ලියන්න (ල 5)

03.

i. පංච සීලයේ අඩංගු ශික්ෂා පද 2ක් ලියන්න (ල 2)

ii. පංචසීලයේ නැති ආජීව අෂ්ටමක සීලයේ අඩංගු ශික්ෂා පද 3ක් ලියන්න (ල 3)

iii. පංචසීලය සුරැකීමේ සමාජ වටිනාකම ඇතුළත් ඡේදයක් ලියන්න (ල 5)

04

i. චතුරාර්ය සත්‍යයේ අංග දෙකක් ලියන්න (ල 2)

ii. ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ල 3)

iii. ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිවෙලින් ලියා එය ත්‍රිවිධ ශික්ෂාවලට වෙන් කොට දක්වන්න (ල 5)

05.

i. අඟු රට චම්පා නුවර විසූ සුප්‍රකට බමුණු පඬිවරයා නම් කරන්න (ල 2)

ii. එම බමුණු පඬිවරයා වර්ණනා කළ බුදුන් වහන්සේ සතු උදාර ගුණාංග 2 ලියන්න (ල 3)

iii. තැනට සුදුසු ලෙස බස හැසිරවීම පිළිබඳව ස්ථාන 3ක් තෝරාගෙන කෙටි හැඳින්වීමක් කරන්න (ල 5)

06. පහත සඳහන් මාතෘකා 2කට කෙටි සටහන් ලියන්න (ල 10)

i. බුදුදහමේ පැමිණීමෙන් ලාංකිකයින්ට ලැබුණු දායාද

ii. විශාඛා මහා උපාසිකාව

iii. සහජීවනය

iv. මෛත්‍රී භාවනාව